## WEATHER FORECAST FOR 30th April 2019
## (Issued at 1200 noon on 29th April 2019)

**The cyclonic storm 'FANI' (pronounced as FONI) over southeast Bay of Bengal to the east of Sri Lanka was located near latitude 8.7N, Longitude 86.9E at 08.30 a.m. today (29), about 580 km east of Batticaloa. It is likely to intensify into a severe cyclonic storm during next 12 hours and further intensify into a very severe cyclonic storm in the subsequent 24 hours. The system is very likely to move northwestwards off the east coast till 1st May and thereafter recurve northeastwards gradually.**

**Cloudy skies, Strong winds and showery condition is expected over the island during next few days.**

Strong winds up to 60 km/h can be expected over the island particularly in Central hilly areas, Northern, North central, North-Western and Southern provinces and in Trincomalee and Ampara districts.

Showers or thundershowers will occur at times over most parts of the island. Very heavy falls above 150 mm can be expected at some places in the Sabaragamuwa, Central, Southern, Western and North-western provinces and in Mannar district and also heavy falls about 100 mm also likely at some places elsewhere.

**General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regards.**

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට නැගෙනහිර දෙසින් පවතින සුළි කුණාටුව ('ෆොනි') 29 වන දින පෙ.ව 08.30 වන විට මඩකලපුව සිට නැගෙනහිර දෙසින් කි.මී 580 පමණ දුරින් උතුරු අක්ෂාංශ 8.7 ත් නැගෙනහිර දේශාංශ 86.9 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුලදී චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඊළඟ පැය 24 තුල ඉතා චණ්ඩ සුළි කුණාටුවක් වේ යැයි අනුමාන කෙරේ. මෙම පද්ධතිය මැයි මස 01 වන දින දක්වා නැගෙනහිර වෙරළට ඔබ්බෙන් වයඹ දෙසට ගමන් කර ඉන්පසුව ක්‍රමයෙන් නැවත හැරී ඊසාන දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

ඉදිරි දින කිහිපයේ දිවයිනේ බොහෝ ප්‍රදේශවල, අහස වලාකුළින් බරව පවතිනු ඇති අතර තද සුළං සහ තද වැසි තත්ත්වයක් පැවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.

දිවයින හරහා විශේෂයෙන් මධ්‍යම කඳුකර ප්‍රදේශ වලත් උතුරු, උතුරුමැද, වයඹ සහ දකුණු පළාත්වලත් ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්ක වලත් විටින් විට හමන පැ.කි.මී. 60 දක්වා තද සුළං බලාපොරොත්තුවේ.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ සබරගමුව, මධ්‍යම, දකුණු, බස්නාහිර සහ වයඹ පළාත්වල සහ මන්නාරම දිස්ත්‍රික්කයේ සමහර ස්ථාන වලට මි.මී.150 ට වැඩි ඉතා තද වර්ෂාපතනයන් ද සෙසු පළාත්වල මි.මී. 100 ක පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැක.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 29th April 2019)

**The cyclonic storm 'FANI' (pronounced as FONI) over southeast Bay of Bengal to the east of Sri Lanka was located near latitude 8.7N, Longitude 86.9E at 08.30 a.m. today (29), about 580 km east of Batticaloa. It is likely to intensify into a severe cyclonic storm during next 12 hours and further intensify into a very severe cyclonic storm in the subsequent 24 hours. The system is very likely to move northwestwards off the east coast till 1st May and thereafter recurve northeastwards gradually.**

Showers or thundershowers will occur at times in sea areas around the island. Heavy showers are likely in the Western, Southern and Eastern sea areas.

Winds will be South-westerly and speed will be 30-40 kmph and it can increase up to 50-60 kmph at times over the sea areas around the island

Wind speed will be 70-80 kmph over the deep sea areas to the South, Southeast, East and Northeast of Sri Lanka and can be very rough to high at times as the wind speed can increase up to 100 kmph at times. Wind speed can increase up to 120-150 kmph in the sea areas within 300km from the center of the system

**The fishermen are advised not to venture into sea areas to the southwestern, Southern, Southeastern, Eastern, Northeastern and Northern of Sri Lanka until further notice.**

**Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019 - 04 - 29
Time : 1235 hrs
Lakmal
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

**<u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>**
**<u>2019 අප්‍රේල් මස 29 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.</u>**

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට නැගෙනහිර දෙසින් පවතින සුළි කුණාටුව ('ෆොනි') 29 වන දින පෙ.ව 08.30 වන විට මඩකලපුව සිට නැගෙනහිර දෙසින් කි.මී 580 පමණ දුරින් උතුරු අක්ෂාංශ 8.7 ත් නැගෙනහිර දේශාංශ 86.9 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුලදී චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඊළඟ පැය 24 තුල ඉතා චණ්ඩ සුළි කුණාටුවක් වේ යැයි අනුමාන කෙරේ. මෙම පද්ධතිය මැයි මස 01 වන දින දක්වා නැගෙනහිර වෙරළට ඔබ්බෙන් වයඹ දෙසට ගමන් කර ඉන්පසුව ක්‍රමයෙන් නැවත හැරී ඊසාන දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. බස්නාහිර, දකුණු සහ නැගෙනහිර මුහුදු ප්‍රදේශ වල තද වැසි ඇති විය හැක.
දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ. සුළගේ වේගය විටින් විට පැ.කි.මී 50-60 දක්වා වැඩි විය හැක.

ශ්‍රී ලංකාවට දකුණු, ගිනිකොණ, නැගෙනහිර සහ ඊසාන දෙසින් වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල පැ.කි.මී 70-80 දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 100 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු සිට දළ රළු වේ. පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 300 දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී 120-150 දක්වා වැඩි විය හැක.

ශ්‍රී ලංකාවට නිරිත, දකුණු, ගිනිකොණ, නැගෙනහිර, ඊසාන සහ උතුරු දෙසින් වන මුහුදු ප්‍රදේශයේ නැවත දැනුම්දෙන තුරු ධීවර සහ නාවුක කටයුතු වලින් වලකින ලෙස ධීවරයන්ට උපදෙස් දෙනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)